**ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව**
தேசிய கொள்வனவு ஆணைக்குழு
**National Procurement Commission**

NPC/CIRCU/2016/01/02
30-08-2016

ජනාධිපති ලේකම්,
අග්‍රාමාත්‍ය ලේකම්,
අමාත්‍ය මණ්ඩල ලේකම්,
අමාත්‍යාංශ ලේකම්වරු,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරු

## ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා කාර්ය සංග්‍රහය සංශෝධනය කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනයේ 19 ආ පරිච්ඡේදය යටතේ 156 'ඇ' වගන්තියට අනුව රාජ්‍ය අංශයේ ප්‍රසම්පාදනය කටයුතු නියාමන ආයතනය ලෙස ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව පිහිටුවා ඇත. එකී ප්‍රතිපාදන අනුව රාජ්‍ය ආයතනවලට භාණ්ඩ හා සේවා, වැඩ, උපදේශක සේවා සහ තොරතුරු පද්ධති ප්‍රසම්පාදනය සඳහා සාධාරණ, යුක්තිසහගත, විනිවිද පෙනෙනසුළු, තරගකාරී සහ වියදම් සඵලතාවයකින් යුතු පටිපාටි හා උපමාන සකස් කිරීමේ කාර්යයට ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව වෙත බලතල පැවරී ඇත.

2. ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව පිහිටුවීම සම්බන්ධව මැයි 30 වන දින ඔබව අමතන ලද මාගේ චක්‍රලේඛයට ඔබගේ කාරුණික අවධානය යොමු කරවීමට කැමැත්තෙමි.

3. ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතනය හා මහ භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති දැනට පවත්නා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා කාර්ය සංග්‍රහය යාවත් කාලීන කිරීමට කොමිෂන් සභාව තීරණය කර ඇති අතර රටෙහි මතුවන අවශ්‍යතා මත සියලු සංශෝධන එක් කොට නව මාර්ගෝපදේශ සකස් කිරීමට කාලය එළඹ ඇත.

4 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ දී ඔබහට මුහුණ දීමට සිදුවූ විවිධ ප්‍රශ්න හා ගැටලු ආශ්‍රයෙන් මෙම මාර්ගෝපදේශ යාවත් කාලීන කිරීම සඳහා ඔබගේ යෝජනා හා නිර්දේශ ලබා ගැනීමට ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව තීරණය කොට ඇත. එමෙන් සංවර්ධන ක්‍රියාවලියට අනුව දැනට පවත්නා මාර්ගෝපදේශ වැඩිදියුණු කිරීම සඳහා ඔබගේ යෝජනා හා නිර්දේශ වඩාත් ප්‍රයෝජනවත් වනු ඇතැයි කොමිෂන් සභාව අදහස් කරයි.


ගොඩනැගිලි අංක 02, කාමර 2/211, බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව,කොළඹ 07,
☎ : 011 267 4128, 011 269 1131- 34 දිගුව - සභාපති: 161, මහ ලේකම්: 163, අතිරේක මහ ලේකම්: 181

கட்டிட இல 02, அறை 2/211, பண்டாரநாயக்க சர்வதேச மாநாட்டு மண்டபம், கொழும்பு- 07.
☎ 011 267 4128, 011 2691131- 34 நீடிப்பு - தலைவர்: 161, செயலாளர் நாயகம்: 163, மேலதிக செயலாளர் நாயகம்: 181

Block No, 02, Room 2/211, Bandaranaike Memorial International Conference Hall (BMICH), Colombo 07
☎ : 011 267 4128, 011 269 1131- 34 Ext - Chairman: 161, Secretary General: 163, Addl. Secretary General: 181

5. එහෙයින්, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වැඩි දියුණු කිරීම සඳහා පහත දැක්වෙන ශීර්ෂ යටතේ ඔබගේ යෝජනා හා නිර්දේශ 2016 සැප්තැම්බර් 30 දිනට පෙර ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ මහ ලේකම් වෙත ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි. එම ශීර්ෂ නම්:

(අ) පවත්නා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා කාර්ය සංග්‍රහය සඳහා අලුතින් ඇතුළත් කළ යුතු සංශෝධන මොනවාද? (කරුණාකර මාර්ගෝපදේශ හා කාර්ය සංග්‍රහ අංක / වගන්ති සඳහන් කරන්න. තවද ඒ ඒ වෙනස් කිරීම්වලට අදාළ හේතු පැහැදිලි කරන්න)

(ආ) තාක්ෂණික වශයෙන් නොගැළපෙන බවට ඔබට පෙනී යන, පවත්නා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා කාර්ය සංග්‍රහයෙහි ඉවත්කළ යුතු වගන්ති මොනවාද?

(ඇ) මෙම කාර්යය හා සම්බන්ධ වෙනත් වැදගත් කරුණු මොනවාද?

(ඈ) මේ සම්බන්ධයෙන් බාහිර පාර්ශ්ව සමඟ කටයුතු කිරීමේ දී ඔබ හඳුනාගත් ගැටලු මොනවාද?

(ඉ) අලුතින් හඳුන්වාදිය යුතු ක්ෂේත්‍ර මොනවාද?

(ඊ) පවත්නා මාර්ගෝපදේශවල ඔබ හඳුනාගත් අර්ථ ව්‍යාකූලතා මොනවාද?

6. ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් නව සංශෝධිත මාර්ගෝපදේශ හා කාර්ය සංග්‍රහය හඳුන්වා දෙන තෙක් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කළ දැනට පවත්නා මාර්ගෝපදේශ කාර්ය සංග්‍රහය සහ සියලු උපදෙස් අනුගමනය කළ යුතුය.

මෙම චක්‍රලේඛය ඔබ යටතේ පවත්නා සියලු ප්‍රසම්පාදන ආයතන වෙත ලැබීමට සලස්වන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

සීතා විතානආරච්චි

මහ ලේකම්,

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව.

පිටපත්: මහ භාණ්ඩාගාරයේ ලේකම්

අධ්‍යක්ෂ ජනරාල්, මහ භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව